

රසික සූරියආරච්චි

# "සූදානම් ශරීරේ"

## ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් යනු කුමක් ද?



"ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස්" යන වචනය මා මුලින් ම ඇසුවේ තායිලන්තයේ බැංකොක් නගරාශ්‍රිතව පිහිටා ඇති ආසියානු තාක්ෂණික ආයතනයේ (AIT) ඉගෙනීම ඇරඹූ සමයේ දී ය. සිංහලෙන් ඒ සඳහා " ආපදා පෙර සූදානම" යන්න යෙදිය හැකි ය.

එකල පශ්චාත් උපාධි ආයතනයක් වූ ආසියානු තාක්ෂණික ආයතනයේ ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් නමින් සුවිශේෂී මධ්‍යස්ථානයක් විය. එක්සත් ජාතීන් ගේ සංගමයේ වාර්තාවක ප්‍රතිඵලයක් ලෙස පිහිටුවා තිබුණු මේ මධ්‍යස්ථානය මගින් සිදු කළ මූලික ම කර්තව්‍යයක් වූයේ ආසියාකරයේ රාජ්‍ය නිලධාරීන් සඳහා මේ විෂය සම්බන්ධයෙන් සති අටක කෙටි පාඨමාලා පැවැත්වීමයි. ඒ පාඨමාලා සඳහා ලංකාවෙන් ද, දිසාපතිලා, උප දිසාපතිලා, ලේකම්ලා සහ වෙනත් නිලධාරීන් සහභාගී වූ බව කියවිණි.

ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් හෙවත් ආපදා පෙර සූදානම යන්න එතෙක් මා අසා නොතිබුණු, එසේ ම, අමුතු ආකාරයක යෙදුමක් වූ බැවින් මම එයින් අදහස් කෙරෙන්නේ කුමක්දැයි මදක් සොයා බැලූවෙමි.

මට වැටහුණු ආකාරයට, ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් යන්නෙන් අදහස් කෙරෙනුයේ ආපදාවකට සාර්ථකව මුහුණ දීම සඳහා, කල් වේලා ඇතුව, මනා සේ සූදානම් වීමයි. එමගින් අපේක්ෂා කෙරෙන්නේ ආපදාවේ අනිසි ඵල ලෙස අනතුරු ඇතිවීම හැකි උපරිම දුරකට වලක්වා ගැනීම සහ එවැනි අනතුරු නිසා සිදුවන හානිය හැකි උපරිම දුරට අඩු කර ගැනීමයි.

ආපදාවකින් අනතුරු, ජීවිත හානි, දේපල හානි සිදු වූ පසු ඒ තත්වය කළමනාකරණය කිරීම ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් විෂයයට අදාළ, නමුත්, වෙනස් වැඩ කොටසකි. ඩිසාස්ටර් මැනේජ්මන්ට් හෙවත් ආපදා කළමනාකරණය ලෙස හැඳින්වෙන්නේ ඒ විෂයයයි.

ගංවතුර, සුනාමි, ගිනිකඳු, නායයාම්, භූමි කම්පා, ලැව් ගිනි යනාදී ආපදා තත්වයන් උදා කරන ස්වාභාවික ව්‍යවසන ඇති බව අපි දනිමු. එසේ ම, දුම්රිය, ගුවන්යානා අනතුරු, ගිනි තැබීම්, ගිනි ගැනීම් යනාදී අවාසනාවන්ත සිදුවීම් ද, ආපදා තත්වයන් උදා කරයි.

ඩිසාස්ටර් ප්‍රිපෙයාඩ්නස් ක්‍රමවේදයෙන් අදහස් කෙරෙන්නේ එසේ ස්වභාවික හෝ මිනිසුන් විසින් ඇති කරන ලද විපත් මගින් අනතුරු-දායක තත්වයන් ඇති වීමේ හැකියාව අවම කර ගැනීමයි. එසේ ම, නොවැළැක්විය හැකි අනතුරු මගින් සිදුවන ජීවිත හානි, දේපල හානි සහ ජන ජීවිතය අවුල්වීම අඩු කර ගැනීමයි.

වැස්ස අපට නැවතිය නොහැක. අවම කළ නොහැක. කෙටි කාලයක් තුල විශාල වැස්සක් විශාල ප්‍රදේශයකට ඇද හැලුණු විට, ඒ වතුර සාමාන්‍ය ස්වභාවික සහ කෘතිම ජල ප්‍රවාහන පද්ධති පරයා පිටාර ගැලීම ද අපට වැලැක්විය නොහැක. මක් නිසා ද යත්, සෑම පද්ධතියක් ම, උපරිම ධාරිතාවය සහිතව සකසා තැබීම ආර්ථිකවශයෙන් ඵලදායී නොවන ඊටත් වඩා බොහෝ විට ප්‍රායෝගිකව කළ නොහැකි කටයුත්තක් වන නිසා ය.

එසේ නම්, අපට කළ හැක්කේ කුමක් ද?

වර්ෂාව වැටුණු පළියට ම, අප එයට තෙමිය යුතු නැත. එසේ ම, වැරදීමකින් හෝ වැස්සට තෙමුණු පළියට හෙම්බිරිස්සාව හදා ගත යුතු ද නැත. එසේ ම, හැදුණු හෙම්බිරිස්සාව, පසුව නිව්මෝනියාවට පෙරළා ගත යුතු ද නැත. නිව්මෝනියාව සැදුණ ද ඒ හේතුවෙන් මිය යා යුතු ද නැත.

ඒ සැම එකකින් ම වැලකී සිටීමට ක්‍රම තිබේ. එසේ ම, අනිසි ප්‍රතිඵල අවම කර ගැනීමට ද ක්‍රම තිබේ. අප කළ යුත්තේ ඒවා සොයා බලා, සැළසුම් කර, සූදානම් ශරීරේ තත්වය උදා කර ගැනීමයි.

එසේම, අනෝරා වැසි වැටුණු පමණින්, ගංවතුර පිටාර ගැලූ පමණින්, කඳු නාය ගිය පමණින් මිනිස් ජීවිත නැති විය යුතු නැත. නිවාස විනාස විය යුතු නැත. ජන ජීවිතය මෙතරම් අඩාල විය යුතු නැත. ඒ සියලූ දේ බොහෝ දුරට හෝ වලක්වා ගැනීමට මෙන් ම, සිදුවන ජීවිත හානි සහ දේපල හානි අවම කර ගැනීමට ද ක්‍රම ඇත.

මේ අනුව, ආපදාවක් ඇති වුණු පසු එයින් වැනසෙන අවුල්වෙන සියළු දේ යථාතත්වයට පත් කිරීම සඳහා මනා ආපදා කළමනාකරණය අවශ්‍ය වුව ද, ඊට වඩා වැදගත් වන්නේ, ආපදා පෙර සූදානම බව පැහැදිළි ය.

හරියටම කිවහොත්, ලෙඩ සෑදී, වැඩ අවුල් වී, ප්‍රතිකාර ගැනීමට පෙර, ලෙඩ නොසෑදෙන පරිදි සෞඛ්‍ය සම්පන්නව සිටීම වැනි ය.

අවාසනාවන්ත තත්වය නම්, ආපදා පෙර සූදානම පිළිබඳව හොඳින් දන්නා අය කිහිප දෙනෙකු හෝ ලංකාවේ සිටිති. තම අමාත්‍යාංශය විසින් ස්වභාවික ආපදාවල දී සිදුවන ජීවිත හානි, යටිතල පහසුකම්වලට සිදුවන හානි සහ ආර්ථියට සිදුවන හානි අවම කර ගැනීමේ වැඩ පිළිවෙලක් පෙළ ගස්වා ඇති බව ආපදා කළමනාකරණ ඇමති, මේ ව්‍යවසනය සිදුවීමට පෙර, අන්තර්ජාතික සමුළුවක දී පුරසාරම් දොඩා ඇති බව ද කියවේ.

නමුත් ප්‍රායෝගිකව ඒ කිසිවක සාර්ථකත්වයක් අපට දක්නට ලැබුණේ නැත

---

19 වන පිටෙන්

අතර දී ''අඳුරෙන් එළියට'' නම් වූ ඉහත සඳහන් පොත් පිංච මා අතට පත් වීම විශාල භාග්‍යයක් කොට සලකන්නේ එයින් බුලත්සිංහල පළාතට විශාල ගෞරවයක් අත්කර දෙමින් ගමේ පිරිසක් විසින් අප්‍රතිහත ධෛර්යයෙන් ගොඩ නගන ලද පාර පිළිබඳව සඳහන් කිරීමට හැකිවීම කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස-"යොදුන් කෝරළයේ ඉපදුණු හැදුණු වැඩුණු පුද්ගලයකු ලෙස මට ද ඇති ආඩම්බර හැඟීම නිසා ය.

පාහියංගල ලෙන පිළිබඳව බොහෝ විස්තර දැනගත් අප පහළට බැස්සේ ද ස්වාමීන් වහන්සේ පසුපසින් ම ය.

නිල්වන් පිරිසිදු දිය දහරාවක් සහිතව පහළින් ගලා යන දොළේ නොනා යාමට කෙසේවත් සිත ඉඩ දෙන්නේ නැත. පහළ දොළට බැස නොගැඹුරු දියේ පැය ගණනක් සෙල්ලම් කොට නිවෙස්වලට යනවිට බොහෝ හවස් වී තිබුණි. එදා අපට කුසගින්න දැනුණේ නිවෙස් කිට්ටුවන විට ය.

අද පාහියංගල එදාට වඩා බෙහෙවින් වෙනස් ය. පසු කාලීනව ඇති වූ වෙනස් කම් අනුව එදා පාහියංගල නැගීමට තිබූ ගල් පඩි පෙළ අඩකින් පමණ අඩු වී ඇත. එසේ ම එදා ගල් පඩි නැග ගිය බොහෝ දුරක් අද වාහනයකින් ම ගමන් කළ හැක. දැන් ගල මුදුනේ ද විහාර කර්මාන්තයක් ආරම්භ කොට ඇත්තේ වර්තමාන විහාරාධිපති පදවිය දරන පූජ්‍ය යටගම්පිටියේ චන්දිම ස්වාමීන් වහන්සේ ගේ මූලිකත්වයෙනි. පසු කල කරන ලද කැනීම් නිසා මෙහි ඉතිහාසය අවුරුදු තිස්හත් දහසක් පැරණි බවක් කියා පායි. පුරාණයේ මිනිස් හිස්කබලක්, මෙන් ම එවකට මිනිසුන් භාවිතා කළ ගල් ආයුද, ආහාරයට ගත් සත්වයන්ගේ නොදිරූ කොටස් ආදිය ද ප්‍රදර්ශනය සඳහා තබා ඇත.

එසේ ඉතා ම මෑතදී එනම් දෙදහස් දොළහ වසරේ දී කරන ලද කැනීම්වලින් වසර දොළොස් දහසකටත් වඩා පැරණි සම්පූර්ණ මිනිස් ඇට සැකිල්ලක් මතුවුණු පුවත මහත් ප්‍රසිද්ධියක් දැරූවකි. පාහියංගල පිං බිමෙන් මතුවන මෙවන් පුරා වස්තූන්ගෙන් ඉපැරණි සංස්කෘතීන් දැන ගැනීමට ලැබෙන අතර අප උපන් කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස-"යොදුන් කෝරළයේ බුලත්සිංහල පළාතට අත්වන කීර්තිය දෙස බලා අපි මහත් සේ ආඩම්බර වෙමු. අනාගත පාහියංගල විහාරස්ථානය ශ්‍රී ලංකාවේ අද්විතීය පූජ්‍යස්ථානයක් බවට පත් වී ගමට, පළාතට මෙන් ම රටට ද විශාල කීර්තියක් අත්කර දෙනු ඇතැයි සිතන්නේ දැඩි විශ්වාසයෙන් යුතුව ය.

(කොළඹ සිට පාහියංගලට යා හැකි මාර්ගය සඳහන් කරනුයේ අපගේ පාඨකයන්ට ද මෙම අපූර්ව ස්ථානය දැක බලා ගැනීමට පහසුවනු පිණිස ය. කොළඹින් හොරණට පැමිණ හොරණින් බුලත්සිංහල හරහා මතුගම දක්වා යන මාර්ගයේ බුලත්සිංහලින් මෝල්කාව මාර්ගයේ හැරී කිලෝ මීටර් හතරක පමණ දුරින් ඇති ගල්කැටිය කඩ මණ්ඩියෙන් වමට ගිය විට පාහියංගල ලෙනට ළඟාවිය හැකි ය. එසේ ම අළුත්ගම හෝ කළුතර සිට මතුගමට පැමිණ මතුගමින් බුලත්සිංහල හරහා හොරණ මාර්ගයේ පැමිණ බුලත්සිංහලින් දකුණට හැරී ඉහත සඳහන් මාර්ග ලකුණු අනුව ළඟාවිය හැකි ය. එමෙන් ම රත්නපුර පැත්තෙන් එන විට රත්නපුර-මතුගම මාර්ගයේ ලත්පඳුර මංසන්දියෙන් දකුණට ඇති මාර්ගයේ මෝල්කාවට පැමිණ මෝල්කාවේ සිට බුලත්සිංහල දක්වා ඇති පාරේ පරගොඩ පාලමෙන් එගොඩ වී ගල්කැටිය හන්දියට පැමිණ දකුණට හැරී පාහියංගලට ළඟාවිය හැකි ය. )

**මතු සම්බන්ධයි**

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1